# නිම් වළල්ල

"ඔයා රිසර්ව්ඩ් (Reserved) ද ? ගෑණු ළමයෙක් පන්හිඳගෙන් ඇහුවා.

"ඇයි ඔයා එහෙම අහන්නෙ?"

"නෑ ඔය "රිසර්ව්ඩ්" කියලා ලියපු ලේබල් එකක් පිටේ එල්ලාගෙන ඉන්නෙ ?" පින්සල පන්ගේ පිට පැත්ත බැලුවමයි කාරණේ තේරුණේ.

"වෙන් කරලා තිබුණ ආසන පේළියේ වාඩිවෙලා උන්නු මහතැන් කෙනෙක් එක්ක ප්‍රසංගය පටන් ගන්න කලින් පන් කතා කර කර උන්නේ ඒ ළඟ හිස් වෙලා තිබුණ තවත් වෙන්කරපු ආසනේකම වාඩිවෙලයි. ඒ ආසනේ අලවලා තිබුණ ලේබල් එක පන්ගේ පිටේ ඇලවිලා.

ඔය ඇබැද්දිය වුණේ තරුපති මුණසිංහ මහත්තයාගේ "ගායනා" කවයේ " හඳුනාගත්තොත් ඔබ මා" ප්‍රසංගය බලන්න ගිහින්. පැන්සලට ප්‍රසංගයට යන්න විවේකයක් තිබුණේ නෑ. ඒ නිසා පන් - පින් දෙන්නා විතරයි ගියේ. පන්ට ප්‍රසංගය ගැන යමක් ලියන්න තිබුණා.

ප්‍රසංගය පටන් ගන්නා ලද්දේ කවයේ සියළුම වැඩිහිටි පිරිස විසින් ගැයූ හැගීම්බර් හදවතට දැණෙනා ගීයකිනි. තරුපති මුණසිංහයන්ගේ පියාණන් වූ ඔස්ටින් මුණසිංහයන් අතින් සංගීතවත්ව විශාරද නන්ද මාලිනිය විසින් " පවන" ප්‍රසංගය සඳහා ගැයූ මොංගෝලියානුවනී ගීයයි ඒ. ප්‍රසංගය අවසානයේදී වාදනය වුයේත් "ආ කාරයෙන්" ගැයුණෝත් ඒ ගී යමයි.

ඉන් අනතුරුව "මාරම්බරී" ගීය රෝහණ කරුණාරත්නායන්ගෙත් "දෙවැනි බුදුන් ලෙස" මහීෂ ගමගේත්, "මා එක්කලා" හසිනි ඉළංගරත්නත්, "මගෙ නාමලී" දයා ෆර්නෑන්ඩුත් ගායනා කරන ලදී. චිත්‍රසේනයන්ගේ "කරදිය" මුද්‍රා නාට්‍යයේ "හෝයියා හෝයියා" සමූහ ගායනයට රංගන උදුම්බරා නර්තනායතනයෙන් ඉදිරිපත් කළ අංගය ඊට කදිමට ගැලපුණි. එය එම මුද්‍රා නාට්‍යයේම නර්තනය යැයි අපගේ මතකයයි. කිසිදු උච්චාරණ අපහසුතාවයකින් තොරව සුරේන්ද්‍රන් වී.වී. "ළදුනේ" ගීය ගැයුවේ සිංහල ගායන පිරිසට අගනා පූර්වාදර්ශයක් දෙමිනි. "පළංචියේ" රෝහණ කරුණාරත්න සහ අසේල දේවේන්ද්‍රත්, "ඇයි තරහෙන්" රුක්මන් විමලසූරියත් කාලගෝල නාඩගමේ "රතඳර සිරියා" රත්නා ගුරුසිංහත්, "පෙම්වතියන්" සුදත් සිසිර කරුණාරත්නත්, "යොවුන් වසන්තේ" ලංකා කූරේත්, "හඬන්නෙක දැන්" ප්‍රියන්ත පෙරේරාත් " පායන ඉර" පුෂ්න තිසේරාත් ගායනා කළහ. " පායන ඉර" වෙනුවෙන් නර්තනය දිනේෂ් ඈපාසිංහ නර්තනාචාර්යවරයාගේ "අභින" රංගායතනයෙනි.

විවේකයෙන් පසුව "මේඝයක් සේ" නලිනි දේවේන්ද්‍ර "රුවන් තාරකා" උපුල් රාජපක්ෂ, " රන්තරු පුන්සඳ" නිරානි පහළවත්ත, "මාස්ටර් සර්" කපිල සේනාධීර, "රොන් සොයා" ක්‍රිස් වෙල්ගම, "රැල්ලෙන් රැල්ලට" රොහාන් විමලසූරිය, "ඉස්සර ආදි කාලෙ" සුනිමල් ප්‍රනාන්දු, "සීගිරි සුකුමාලියේ" බන්දුල වේලාතන්ත්‍රි යන අය විසින් ගායනා කරනා ලදී. "ඉරෙන් හඳෙන්" සහ "අතුරු මිතුරු" ළමා ගීත ළමා පිරිස විසින් ද "උදුම්බරා", "සඳකැන් දහරින්" සහ "පිපී පිපී" ගීත වැඩිහිටි පිරිස විසින්ද ගායනා කරන ලදී. "පිපී පිපී" ගීතයට ද රංගන උදුම්බරා නර්තනායතනයෙන් නර්තනයක් ඉදිරිපත් විය. "උදුම්බරා" ගීතය ගායනයේදී විවිධ ස්වර පරාසවල ගායනාවන් පෑහී යන සේ මිශ්‍රණය කර ගායනා කිරීම හොඳින් පුහුණු වී ඉදිරිපත් වූ බව පෙණින. මනා සංයමයෙන් යුතුව කළ මෙම ඉදිරිපත් කිරීම ඉදිරියේ සිට මෙහෙයවූයේ මුණසිංහයන් විසිනි.

ප්‍රසංගයට කලින් තරුපති මුණසිංහයන් විසින් මාධ්‍යයන්ට ප්‍රකාශ කර තිබූ පරිදි වෘත්තීය ශිල්පීන් නොවන පිරිසක් වෙතින් ඉදිරිපත් වුණ ගායනාවන් ඒ ඒ සාමාජිකයින්ගේ කුසලතාවන් මත රඳා පැවතිණ. කෙසේ වුවද ඒ ඒ අය ගීත තෝරා ගැනීම හෝ ඒඅ යට ගීත තෝරා දීම නිසියාකාරව සිදු වී ඇති බැව් නම් පැහැදිළි විය. ඒකල ගායනා කළ දරු දැරියන් වෙනුවෙන් ඒ අයට ගැලපෙන ළමා ගීත ගැයීමට ලැබුණේ නම් වඩාත් මැනැවැයි සිතේ. ඒකාකාරී බවින් මිදීමට වේග රිද්මයේ ගීත ඉදිරිපත් වුවද ඒ අය හට අනෙක් ගීත ගැයීමට ඇති හැකියාවන් ඉදිරිපත් කිරීමට ඉන් ඉඩ ඇහිරිණිදැයි සිතෙයි.

තමන්ගෙන් වසර හතරක කාලයක් ගායනය හැදෑරූ පිරිස වෙතින් තරුපති මුණසිංහ තිළිණ



ලබමින් බුහුමනට පත් වීය. ඒ කෘතවේදී බව ඔහු සංවේදී කරවමින් නෙතට කඳුලක් නැංවීමට සමත් විණ.

පහුවුණ මාසයේ පන්, පින්, පැන් තුන්දෙනාටම සහභාගී වෙන්න ලැබුණ තවත් උත්සවයක් තමා "ස්කැටිස්" සංවිධානයෙන් ඉදිරිපත් කරපු කෙටි චිත්‍රපටි උත්සවය. ඒ ගැනත් යමක් නොලිව්වොත් හොඳ මදිය කියලා පන්ට හිතුණා. චිත්තරපටි කරුමාන්තෙ ගැන නම් පන් දන්නෙ ප්‍රේක්ෂකයෙක් දන්න තරම විතරමයි.

මෙම උත්සවයේ අධ්‍යක්ෂවරයා ලෙසින් කටයුතු කළේ උපා උපදස මහත්මායි. කෙටි චිත්‍රපට අටකින් යුක්ත වූ උළලේ සියලුම චිත්‍රපට ඉංග්‍රීසි මාධ්‍යය මුල් කොටගෙන නිපදවූ නිෂ්පාදන විය. ඉන් ඇතැම් චිත්‍රපට වෙනුවෙන් සිංහල බස් කැවී තිබිණ. අරෝෂ ජයවර්ධනගේ "ජජ්මන්ට් ඩේ" (Judgment Day) ආචාර්ය සාරා ආරච්චි ගේ " ජර්නි ටු ෆ්‍රීඩම්" (Journey to Freedom) මන්ජිත චන්ද්‍රජිත්ගේ "ගුඩේ" (ඨමා්හ) ප්‍රසාද් විජයබාහු ගේ "සික්ස් පොයින් ෆයිව්" (6 Point 5) ජේ. එස්. කනහැර සහ රාගු රාජ්කුමාර්ගේ " නොට් සෝ ලකී සින්හ්" (Not so Lucky Singh) ශාන්ත ජයසිංහගේ "හව් හාර්ඩ් ඩිඩ් යූ ට්‍රයි" (How hard did you try ) සෙන් ගාසියාගේ "ද සෙට් අප්" (The set-up) අනුරුද්ධ උෂාන්ගේ " ටිල් ද ඩේ කම්ස්" (Till the day comes) මේ කෙටි චිත්‍රපට අටයි.

මෙම චිත්‍රපට පිළිබඳව කෙටි විමර්ෂන ආචාර්ය ඉයන් වික්සන් සහ ශ්‍යාම් එදිරිවීර යන ඒ පිළිබඳව දැනුමැති දෙපළ විසින් එවේලේම කළ අතර, සහභාගී වූ සියළු චිත්‍රපට වෙනුවෙන් තිළිණ ප්‍රධානය වීය.

"ස්කැටි" සංවිධානය විසින් වසර දෙක තුනක පටන් පවත්වාගෙන එන මෙම කෙටි චිත්‍රපට උළෙලේ සංකල්පය දිලිනි ප්‍රනාන්දු යෞවනිය සතු වේ. ඇයගේ සංකල්පයට අනුව ඇය ඉදිරිපත් කළ ව්‍යාපෘතිය කෙතරම් සාර්ථක වීද යත් බලාපොරොත්තු වුවාටත් වැඩියෙන් ඒ සඳහා අරමුදල් වෙන් විණ. මෙවර කෙටි චිත්‍රපට උත්සව වේදිකාවේ දී ඒ වෙනුවෙන් ඇයව ඇගයීමට ලකම්ම ඉතාමත් වැදගත් සිද්ධියකි.

ශ්‍රී ලාංකේය සම්භවයක් ඇති සංක්‍රමණිකයින් වන පළමු පරම්පරාවට මෙන්ම දෙවන පරම්පරාව වන දිළිනි දියණියගේ පරම්පරාවට ද ඉළක්ක කරගනිමින් ඇය ඉදිරිපත් කළ මෙම ව්‍යාපෘතිය කෙතරම් දුරට ඔවුන් වෙත යන්නේ වැඩි වශයෙන් ඔවුන් අප හා යා වුණද ඔවුන් කරගෙන යන්නේ ඔවුන් රිසි දේ ද; නැතහොත් අප රිසි දේ ද යන්න ගැටළුවකි.

අප සිත්වල ඇතිවන ඒ ගැටළුව මදක් හෝ විසඳගත හැකි වන්නේ අපගේ දෙවන පරපුරේම අයගෙන් ඒ පිළිබඳව විමසීමෙන් නොවේද ? පරම්පරා දෙකක් අතරේ මුහු වී ඒවා යා කිරීමට මං සළසන සංකල්පක ඉදිරිපත් කළ දිළිනි ප්‍රනාන්දු දියණිය මේ සඳහා අප දුරකථනයෙන් සම්බන්ධ කරගත්තේ ඇයගේ විවෘත බවත්, සුහදශීලී බවත් නිසාම පමණක් ම නොවේ. ඇය ඊට සුදුසු යෞවනියක වන නිසාවෙනි.

"ඇත්තට ම අපි මේ කෙටි චිත්‍රපට උළෙලට ඉළක්ක කරගත්තේ කණ්ඩායම් තුනක්. අපේ ජන සමාජයේ පළවෙනි පරම්පරාව, ඔවුන්ගේ දරුවන් වෙන දෙවෙනි පරම්පරාව වගේම දෙමව්පියන් නැතිව තනිවම මේ රටට අධ්‍යාපන කටයුතු වලට ශ්‍රී ලංකාවෙන් ආව තරුණ පිරිස."

ඉතින් විවිධ තල වල විවිධ පුද්ගලයින් මේ කටයුත්තෙදි එකතු වුණා එකම අරමුණකට. චිත්‍රපටි එකින් එක වෙනස් වුණාත් කෙටි චිත්‍රපටි උත්සවයට දයකවෙන එකම අරමුණය මේ අයට දැයි සිතිය යුතුව ඇත්තේය. ඊට බාධක වේ නම් ඒ මොනවාදැයි සොයා බැලිය යුතුව ඇත්තේය. අපගේ දෙවන පරපුරෙහි දරුවන් සිය විශ්ව විද්‍යාල තුල කරගෙන යන්නා වූ ඇතැම් නිර්මාණාත්මක දේ පිළිබඳව ඉඟියක් විටෙක ඩී. බී. කුරුප්පු මහත්මාගේ ලිපියක විය. ඒ දේ පිළිබඳව අප දැණුවත් නොවන්නේ ඇයි ? ඒ අදහස් අප හට සම්ප්‍රේෂණය නොවන්නේ ඇයි ?

මෙම උත්සව දෙකේදීම අප හට දැණුන එක දෙයක් වී නම් ළමා විය හා යෞවනය අප හා කෙතරම් දුරට බද්ධ වී ඇතිද යන ගැටළුවයි. අඩු

## පන්හිඳයි පින්සලයි

සිසිර දිසානායක

තිබුණෙ. කෙටියෙන් හරි තමන්ගේ කතාවක් කියන්න තියෙන, ඒ වගේම ඒවා කියන්න කැමති පිරිසක් මේ.

"සිනමාව අද හුඟක් දෙනෙක් උනන්දු වෙන ජනප්‍රිය කලාවක්. ඒ වගේම ඒක ලේසි දෙයක් වෙලයි තියෙන්නේ මේ වෙනකොට. ඒ වගේම සිනමාවට අවතීර්ණ වෙන්නත් පහසුයි. ඉතින් ඔය දේවල් ගැන හිතලයි මම මේ සංකල්පය ගෙනාවේ. ඒ අනුවයි ව්‍යාපෘතියක් ගොඩනැගුවේ."

"මුල් වතාවේ මේ දේ කරනකොට අපිට ටිකක් අපහසු වුණා. මේ වැඩේට ඉතිහාසයක් තිබුණෙ නැති නිසා කෙනෙකුට පැහැදිලි කරන්න පෙන්නන්න නිදර්ශන තිබුණෙ නෑ. මේ වතාවේ අපි කරන්න ඕන දේ කළාය කියලයි මට හිතෙන්නේ. පහුගිය වතාවේ නිදර්ශන වගේම අපිට අත්දැකීම් එහෙමත් එකතු වුණානේ. ඒවා අපි මේ වැඩේ සාර්ථක කරගන්න පාවිච්චි කළා"

"ඉදිරි වර්ෂවලදී මේ උත්සවය තවත් ඉදිරියට ගෙනියන්න නම් අපේ සංස්කෘතියට අමතරව වෙනත් රටවලට අයිති සංස්කෘතික දේවල් මේ කෙටි චිත්‍රපටි වලට එකතු වෙන්න ඕන. එහෙමනම් ඒ අනික් රටවල් වලින් මෙහාට සංක්‍රමණය වුණ අය, ඒ අයගේ දු දරුවන් වගේම ඒ රටවල්වලින් මේ රටට අධ්‍යාපනයට ආව අයත් සම්බන්ධ කරගන්න ඕන."

ඒ දිළිනි දියණියගේ අදහස්. "සන්නස" පාඨකයන් වෙනුවෙන් අපි ඇයට ස්තූතිවන්ත වුයෙමු. එදින කෙටි චිත්‍රපට උළෙල නිමා කරමින් උපා උපදස මහත්මා කළ කථාවේදී කියවුණා වැදගත් කාරණයක් නම් මේ පිරිසම එකට ගත් කළ ඉතා හොඳ සිනමා නිර්මාණයක් කළ හැකි නොවේද යන්නයි. එකිනෙකා පරයා තරඟ වදිනු වෙනුවට සැවොම එක්ව යහපත් දෙයක් ඉදිරිපත් කිරීමේ වටිනාකම සිනමාවය පමණක් සීමා නොවේ.

වසර 1970 නොවැම්බර් මස දහ අට වනද මුල්ම වතාවට මව් බිමේ සිසුන් කීප දෙනෙක් එක්ව එළි දැක් වූ "නිම් වළල්ල" සිනමා පටය සිහිපත් වෙයි. මීට වසර හතළිස් දෙකකට පෙර කොළඹ ආනන්ද විද්‍යාලයේ රංජිත් ලාල් පීරිස් ඇතුළු ශිෂ්‍ය පිරිස නිෂ්පාදනය කළ මෙම සිනමා පටය හැත්තෑව දශකයේ බිහි වූ හරවත් සිනමා පට පෙළට එක් විය. ගායනයට දයක වූ වික්ටර් රත්නායකයන් එවකට ප්‍රවීණත්වයට වඩා බරව සිටියේ ආධුනික යෞවනත්වයටයි. රත්නායකයන් හැර අන් සියලු දෙන පාසැල් ශිෂ්‍යයෝ වූහ. ඉතාමත් අඩු තාක්ෂණික දැණුම හා පහසුකම් මධ්‍යයේත් හීන මූල්‍යමය තත්ත්වයන් යටතේත් මීට වසර හතළිහකට පෙර අපගේ පාසැල් සිසුන් අතින් චිත්‍රපටයක් නිෂ්පාදනය වී නම්, ජංගම දුරකථනයේ පටන් ඉහළම තාක්ෂනය දක්වා විහිද ගිය දැණුම් පරාසයකින් යුත් වර්තමානයේ සිටින අපගේ දරු පිරිස අතරින් අපට මොන තරම් දේ බලාපොරොත්තු විය හැකිද ?

■

# Upgrading Thurstan College Computer Lab

By OBU Australia

The first stage of upgrading the Thurstan College Computer Lab, a project by Thurstan college OBU Australia, Brand new computers were donated to the college as part of the ongoing project which we hope to complete by the end if this year (2012) A big thank you to all the Thurstanites who helped with this project and we would like to welcome any old Thurstanites living in Australia to join with us.